# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1837/27 - 2013 නොවැම්බර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2013.11.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු නිවේදනයයි

රේගු ආඥාපනත (235 වන අධිකාරය)

2003 අංක 2 දරන රේගු (සංශෝධිත) පනතේ "ඊ" උපලේඛනයේ 10 වන වගන්තිය යටතේ නියෝගය

පාවිච්චි කරන ලද මෝටර් වාහන සඳහා අඩුකළ වටිනාකම (මිල) ගණනය කිරීම

2003 අංක 2 දරන රේගු (සංශෝධිත) පනතේ "ඊ" උපලේඛනයේ අංක 10 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මහින්ද රාජපක්ෂ වන මම, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා වශයෙන් අංක 87.01, 87.02, 87.03, 87.04 සහ 87.11 යන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ යටතේ වර්ගීකරණය වන ආනයනය කරනු ලබන පාවිච්චි කළ මෝටර් වාහන සඳහා වටිනාකම (මිල) නියම කිරීම වර්ෂ 2013 නොවැම්බර් මස 22 වැනි දින සිට බලපවත්වන පරිදි පහත සඳහන් ලෙස සිදු කල යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

අදාළ වාහනයේ ප්‍රථම ලියාපදිංචි කිරීමේ දිනය හා නැව්ගත කළ දිනය (නැව් භාර පත්‍රයේ දිනය) අතර කාලය, වාහනය පාවිච්චි කරන ලද කාලය වශයෙන් සළකනු ලැබේ.

අදාළ වාහනය ප්‍රථම ලියාපදිංචි කිරීමේදී මාසය හා වර්ෂය පමණක් සඳහන් කර ඇති අවස්ථාවක, ඊළඟ මාසයේ 01 දිනය වාහනයේ ප්‍රථම ලියාපදිංචි කිරීමේ දිනය ලෙස සළකනු ලැබේ.

අදාළ වාහනය ප්‍රථම ලියාපදිංචි කිරීමේදී වර්ෂය පමණක් සඳහන් කර ඇති අවස්ථාවක, එම වර්ෂයේ ජූලි 01 වැනි දින එහි ප්‍රථම ලියාපදිංචි කිරීමේ දිනය ලෙස සලකනු ලැබේ.


1A - PG 01838 — 800 (2013/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**පාවිච්චි කරන ලද මෝටර් වාහන සඳහා අඩුකළ වටිනාකම (මිල) ගණනය කිරීමේ වගුව**

| *පාවිච්චි කරන ලද කාල පරිච්ඡේදය* | *අඩුකළ FOB (නැව තෙක් නොමිලේ) වටිනාකම* |
|---|---|
| අවුරුද්දකට වැඩි සහ අවුරුදු 2 දක්වා | 90% |
| අවුරුදු 2 ට වැඩි සහ අවුරුදු 3 දක්වා | 80% |
| අවුරුදු 3 ට වැඩි සහ අවුරුදු 4 දක්වා | 75% |
| අවුරුදු 4 ට වැඩි සහ අවුරුදු 5 දක්වා | 65% |
| අවුරුදු 5 ට වැඩි සහ අවුරුදු 6 දක්වා | 60% |
| අවුරුදු 6 ට වැඩි සහ අවුරුදු 7 දක්වා | 55% |
| අවුරුදු 7 ට වැඩි සහ අවුරුදු 8 දක්වා | 50% |
| අවුරුදු 8 ට වැඩි සහ අවුරුදු 9 දක්වා | 45% |
| අවුරුදු 9 ට වැඩි සහ අවුරුදු 10 දක්වා | 40% |
| අවුරුදු 10 ට වැඩි | 35% |

පාවිච්චි කරන ලද මෝටර් වාහන සඳහා වටිනාකම (මිල) ගණනය කිරීමේ ක්‍රමය මෙහි උපලේඛන (1) පරිදි සිදු කෙරේ. මෙම නියෝගය 2013.11.22 දින සිට වර්ෂ 2ක කාල සීමාවක් සඳහා බලපැවැත්වේ.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
(මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය).

2013 නොවැම්බර් මස 21 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය (I)

**පාවිච්චි කරන ලද මෝටර් වාහන සඳහා වටිනාකම (මිල) ගණනය කිරීම**

සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ 87.01, 87.02, 87.03, 87.04 සහ 87.11 යටතේ වර්ගීකරණය කරනු ලබන පාවිච්චි කරන ලද මෝටර් වාහනයක රේගු වටිනාකම පහත සඳහන් අගයන්හි එකතුව වේ -

(අ) පහත (i) හා (ii) හි සඳහන් අන්‍යොන්‍ය අගයන්ගෙන් වැඩි අගය ;

(i) පහත (iii) හි නිර්වචනය කොට ඇති පරිදි ලබාගන්නා ලද ක්ෂය වටිනාකම,

(ii) ඉන්වොයිසියේ සඳහන් FOB වටිනාකම (නැව තෙක් නොමිලේ මිල),

(iii) මෝටර් වාහනයක ක්ෂයවීමෙන් පසු වටිනාකම යනු රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලබන පරිදි අළුත්ම වාහනයක නැව තෙක් නොමිලේ (FOB) වටිනාකම පදනම් කරගෙන පාවිච්චි කරන ලද මෝටර් වාහන සඳහා අඩුකළ වටිනාකම (මිළ) ගණනය කිරීමේ වගුව අනුව ගණනය කරන ලද ක්ෂය වටිනාකම වේ.

(ආ) ශ්‍රී ලංකාවේ වරාය දක්වා ප්‍රවාහන ගාස්තු,

(ඇ) ශ්‍රී ලංකාවේ වරාය දක්වා ප්‍රවාහන කිරීමට අදාළ පැටවීම, බෑම සහ අදාළ මෙහෙයුම් ගාස්තු,

(ඈ) ශ්‍රී ලංකාවේ වරාය දක්වා රක්ෂණ වාරිකය.

12 - 252

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.